# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2308/29 - 2022 දෙසැම්බර් මස 01 වැනි බ්‍රහස්පතින්දා - 2022.12.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/1978 (x) (ආ)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වැනි වගන්තිය යටතේවන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25(අ) වන වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති සමාගමක් වන, ලියාපදිංචි අංක පී.වී. 66705 දරන, උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගනු ලබන කාට්සු-හයිලි ඇඩ්වාන්ස්ඩ් මෙඩිකල් ටෙක්නොලොජි ට්‍රේනින් සෙන්ටර් (ප්‍රයිවට්) ලිමිටඩ් (කේ.අයි.යූ) ආයතනය සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසු, මේ නියමය මගින්, එකී පනත යටතේ සාදන ලද 2022 පෙබරවාරි මස 25 වැනි දින අංක 2268/89 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ II වන උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන ''කළමනාකරණ තොරතුරු පද්ධති පිළිබඳ විද්‍යාවේදී ගෞරව'' යන සටහනට ඉක්බිතිව ම, මෙහි II වන උපලේඛනයේ, පිළිවෙලින් I වන සහ II වන තීරයන්හි නිශ්චිතව සඳහන් සටහන්, මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කොන්දේසිවලට යටත්ව එකතු කිරීම මගින් එම නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

**I වන උපලේඛනය**

**කොන්දේසි**

1. කාට්සු-හයිලි ඇඩ්වාන්ස්ඩ් මෙඩිකල් ටෙක්නොලොජි ට්‍රේනින් සෙන්ටර් (ප්‍රයිවට්) ලිමිටඩ් (කේ.අයි.යූ) ආයතනය විසින්, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් උපාධි පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී, අවම අධ්‍යයන සම්භාර 120ක් සහිතව සම්පූර්ණ කළ යුතු (S.L.Q.F. 6 වන මට්ටම) ව්‍යාපාර විශ්ලේෂණය පිළිබඳ කළමනාකරණ ගෞරව උපාධිය සම්බන්ධයෙන් -

(අ) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී වාණිජ විෂයය ධාරාවෙන් සාමාන්‍ය සාමාර්ථ (''S'') තුනක් (3) එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම ; හෝ



මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

(ආ) නිශ්චිත බලධරයා විසින් පිළිගත් එයට ඇදුණ පාඨමාලාවක් සමග ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී කවර හෝ විෂයය ධාරාවකින් සාමාන්‍ය සාමාර්ථ (''S'') තුනක් (3) එකවර ලබා තිබීම.

යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතු ය.

2. නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන පස් අවුරුදු (5) ප්‍රතිසමාලෝචනයට යටත්ව මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධිය පිරිනැමීම සඳහා කාට්සු-හයිලි ඇඩ්වාන්ස්ඩ් මෙඩිකල් ටෙක්නොලොජි ට්‍රේනින් සෙන්ටර් (ප්‍රයිවට්) ලිමිටඩ් (කේ.අයි.යූ) ආයතනය පිළිගනු ලැබිය යුතු ය.

**II වන උපලේඛනය**

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*උපාධිය සඳහා වන කෙටි යෙදුම* |
|---|---|
| ව්‍යාපාර විශ්ලේෂණය පිළිබඳ කළමනාකරණ ගෞරව | බීඑම්ජීටී ගෞරව (ව්‍යාපාර විශ්ලේෂණය) |

ආචාර්ය **ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත** (පා.ම.),
අධ්‍යාපන අමාත්‍ය.

2022 නොවැම්බර් මස 23 වැනි දින,
කොළඹ දී ය.

EOG 12 - 0016/1

---

එල්.ඩී.බී. 21/1978 (x) (ආ)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වැනි වගන්තිය යටතේවන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වන වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති ලියාපදිංචි අංක පී.වී. 101137 දරන, 2021 ජනවාරි මස 13 වැනි දින අංක 2210/18 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමය මගින් උසස් අධ්‍යාපනය වර්ධනය කිරීමේ කාර්යය සඳහා සිවිල් ඉංජිනේරු විද්‍යා පිළිබඳ ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව උපාධිය ප්‍රදානය කිරීම සඳහා යොමු කරන්නා වූ උපාධිය ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් පිළිගනු ලබන එස්.එල්.ටී. කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් එකී පනතේ 70ඇ වන වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, එකී නියමයේ I වන උපලේඛනයේ 2 වන කොන්දේසියේ දැක්වෙන ''ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකමට අනුකූලව කටයුතු කළ යුතු ය.'' යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් එකී නියමය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

''ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකමට අනුකූලව කටයුතු කළ යුතු ය:

එසේ වුව ද, මෙහි නිශ්චිතව දක්වා ඇති අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම් තිබේ නම්, සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව හැදෑරීමට 2015.05.07 වන දිනයෙන් ආරම්භ වී 2018.01.10 වැනි දිනයෙන් අවසන් වන කාලසීමාව තුළ දී (2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ යථා පරිදි සංස්ථාපිත කරනු ලැබූ ලියාපදිංචි අංක පී.වී. 64641 දරන සමාගමක් වන) සවුත් ඒෂියන් ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නොලොජි ඇන්ඩ් මෙඩිසින් (ප්‍රයිවට්) ලිමිටඩ් (සායිටම්) ආයතනයේ

ලියාපදිංචි වූ සිසුන්ට සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව උපාධියට අදාළව මෙහි සඳහන් කර ඇති උපාධි පාඨමාලාව සඳහා ඇතුළත් කරගනු ලැබීමට සුදුසුකම් ලැබිය යුතු ය.''

ආචාර්ය **ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත** (පා.ම.),
අධ්‍යාපන අමාත්‍ය.

2022 නොවැම්බර් මස 22 වැනි දින,
කොළඹ දී ය.

EOG 12 - 0016/2

---

එල්.ඩී.බී. 21/1978 (X) (ආ)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වැනි වගන්තිය යටතේවන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වන වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති ලියාපදිංචි අංක පී.වී. 101137 දරන, 2020 ජනවාරි මස 06 වැනි දින අංක 2157/3 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය මගින් උසස් අධ්‍යාපනය වර්ධනය කිරීමේ කාර්යය සඳහා යාන්ත්‍ර විද්‍යුත් පිළිබඳ ඉංජිනේරු විද්‍යා ගෞරව උපාධිය ප්‍රදානය කිරීම සඳහා යොමු කරන්නා වූ උපාධිය ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් පිළිගනු ලබන එස්.එල්.ටී. කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් එකී පනතේ 70ඇ වන වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, එකී නියමයේ I වන උපලේඛනයේ 1 වන කොන්දේසියේ (ii) වන ඡේදයේ දැක්වෙන ''ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකමට අනුකූලව කටයුතු කළ යුතු ය.'' යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් එකී නියමය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

''ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකමට අනුකූලව කටයුතු කළ යුතු ය:

එසේ වුව ද, මෙහි නිශ්චිතව දක්වා ඇති අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම් තිබේ නම්, යාන්ත්‍ර විද්‍යුත් පිළිබඳ ඉංජිනේරු විද්‍යා ගෞරව උපාධි පාඨමාලාව හැදෑරීමට 2015.05.07 වන දිනයෙන් ආරම්භ වී 2018.01.10 වන දිනයෙන් අවසන් වන කාලසීමාව තුළ දී ( 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ යථා පරිදි සංස්ථාපිත කරනු ලැබූ ලියාපදිංචි අංක පී.වී. 64641 දරන සමාගමක් වන) සවුත් ඒෂියන් ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නොලොජි ඇන්ඩ් මෙඩිසින් (ප්‍රයිවට්) ලිමිටඩ් (සායිටම්) ආයතනයේ ලියාපදිංචි වූ සිසුන්ට යාන්ත්‍ර විද්‍යුත් පිළිබඳ ඉංජිනේරු විද්‍යා ගෞරව උපාධියට අදාළව මෙහි සඳහන් කර ඇති උපාධි පාඨමාලාව සඳහා ඇතුළත් කරගනු ලැබීමට සුදුසුකම් ලැබිය යුතු ය.''

ආචාර්ය **ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත** (පා.ම.),
අධ්‍යාපන අමාත්‍ය.

2022 නොවැම්බර් මස 23 වැනි දින,
කොළඹ දී ය.

EOG 12 - 0016/3

එල්.ඩී.බී. 21/1978 (x) (ඇ)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වැනි වගන්තිය යටතේවන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 27(1)(ආ) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කොට ඇති සමාගමක් වන, ලියාපදිංචි අංක පී.වී. 94125 දරන, උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගනු ලබන නාගානන්ද ඉන්ටර්නැෂනල් ඉන්ස්ටිටියුට් ෆො බුඩිස්ට් ස්ටඩීස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසු, මේ නියමය මගින්, එකී පනත යටතේ සාදනු ලැබූ 2022 ඔක්තෝබර් මස 10 වැනි දින අංක 2301/19 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමයේ II වන උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන ''තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව'' යන සටහනට හා එහි II වන තීරයේ අනුරූප සටහනට ඉක්බිතිව ම, මෙහි II වන උපලේඛනයේ පිළිවෙලින් I වන සහ II වන තීරයන්හි නිශ්චිතව සඳහන් සටහන් මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කොන්දේසිවලට යටත්ව එකතු කිරීම මගින් එම නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

**I වන උපලේඛනය**

**කොන්දේසි**

1. නාගානන්ද ඉන්ටර්නැෂනල් ඉන්ස්ටිටියුට් ෆො බුඩිස්ට් ස්ටඩීස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින්, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් උපාධි පාඨමාලාවන් සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී, අවම අධ්‍යයන සම්භාර 120ක් සහිතව සම්පූර්ණ කළ යුතු (S.L.Q.F. 6 වන මට්ටම) මානව විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය සහ ව්‍යවහාරික සන්නිවේදනය සහ මාධ්‍ය තාක්ෂණය පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ කවර හෝ විෂයය ධාරාවක් යටතේ සාමාන්‍ය සාමාර්ථ (''S'') තුනක් (3) එකවර ලබා තිබීම යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතු ය.

2. නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන පස් (5) අවුරුදු ප්‍රතිසමාලෝචනයකට යටත්ව මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන උපාධිය පිරිනැමීම සඳහා නාගානන්ද ඉන්ටර්නැෂනල් ඉන්ස්ටිටියුට් ෆො බුඩිස්ට් ස්ටඩීස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය හඳුනාගනු ලැබේ.

**II වන උපලේඛනය**

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*උපාධිය සඳහා වන කෙටි යෙදුම* |
|---|---|
| මානව විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව | බී ඒ ගෞරව (මානව විද්‍යාව) |
| ව්‍යවහාරික සන්නිවේදනය සහ මාධ්‍ය තාක්ෂණය පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව | බී ඒ ගෞරව (ව්‍යවහාරික සන්නිවේදනය සහ මාධ්‍ය තාක්ෂ-ණය) |

ආචාර්ය **ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත** (පා.ම.),
අධ්‍යාපන අමාත්‍ය.

2022 නොවැම්බර් මස 23 වැනි දින,
කොළඹ දී ය.

EOG 12 - 0016/4

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.